THE CHATHAM STREET JOURNAL
DAILY SHOT
Trust your source. Trust your decisions.
2024 | 04 | 09

# ඉන්ධන පාරිභෝජනය 50%කින් අඩුවීම බොරුවක්!

## මෙන්න ඇත්තම කතාව

| SALES COMPARISON | | | | |
|---|---|---|---|---|
| Product | 1st Quarter Sales (Daily Avg.) | | Difference (In L) | Percentage (%) |
| | 2023 (In L) | 2024 (The Period Reviewed) (In L) | | |
| Lanka Auto Diesel | 8,855,311 | 8,074,727 | (780,583) | -9 |
| Lanka Petrol 92 Oct | 10,221,911 | 9,250,941 | (970,970) | -9 |
| Lanka Kerosene | 653,164 | 1,328,924 | 675,759 | 103 |
| Lanka Super Diesel 04 Star Euro 04 | 196,396 | 190,049 | (6,346) | -3 |
| Lanka Petrol 95 Oct Euro 04 | 228,476 | 216,919 | (11,557) | -5 |

මෙරට ඉන්ධන පාරිභෝජනය මේ වන විට සියයට 50 කින් අඩු වී ඇති බවට පසුගියදා ඛනිජ තෙල් බෙදාහරින්නන්ගේ සංගමය විසින් ප්‍රකාශ කළ බවට පුවතක් වාර්තා වී තිබිණි. එහෙත් කවර මූලාශ්‍රයන් ආශ්‍රයෙන් එම සංගමය එලෙස ප්‍රකාශ කළාද යන්න තොරතුරු වාර්තා වී නොතිබිණි.

කෙසේ නමුත් මෙම පුවත විපක්ෂ කොටස් විසින් ආණ්ඩුවේ දුර්වලතාවයක් ලෙස අර්ථකථනය කිරීමට පෙළඹී තිබිණි. විශේෂයෙන්ම ඉන්ධන මිල ඉහළ යාම, ජනතාවගේ ආර්ථික හැකියාවන් දුර්වල වීම ආදිය මෙයට හේතු වශයෙන් පැවැසිනි. එසේම රට බංකොලොත්භාවයෙන් මුදවා රටේ ආර්ථික යම් ස්ථාවරත්වයකට පත් කර ඇති බවට රජයේ පාර්ශ්වයෙන් කෙරෙන ප්‍රකාශයන් සත්‍යයෙන් තොර බවට මතයක් නිර්මාණය කිරීමට මෙම පුවත ජනතාව නොමඟ යන ලෙස පාවිච්චි කිරීම දකින්නට ලැබිණි.

ජනමාධ්‍ය තුළ ප්‍රකාශයට පත් වන හෝ වගකිව යුතු කවුරුන් විසින් හෝ ප්‍රකාශයට පත්කරන තොරතුරු පරම සත්‍ය ලෙස විශ්වාස කරන්නන් මෙම පුවතත් සත්‍යයක් ලෙස භාරගෙන තිබුණේ කිසිදු සොයා බැලීමකින් තොරවය.

අප මේ පිළිබඳ අදාල වගකිව යුතු පාර්ශ්වවලින් කළ විමසීමේදී මෙම තොරතුරු මුළුමනින්ම අසත්‍ය බව හෙළිදරව් විය.

2022 වසරේදී ආර්ථික අර්බුදය නිසා මෙරට බරපතල ඉන්ධන හිඟයක් ඇතිව තිබිණි. අත්‍යාවශ්‍ය කටයුතු වෙනුවෙන් හෝ ඉන්ධන ලබා ගැනීමේ හැකියාවක් නොතිබිණි. මෙරටට ඇණවුම් කරන ලද ඉන්ධන රට තුළට ගැනීම සඳහා අදාල මුදල් ගෙවීමේ හැකියාවක් නොතිබිණි. ඉන්ධන නැව් වරායෙන් එපිට නැංගුරම් දමා දින ගණන්, සති ගණන් තිබුණි. ණයවර ලිපි විවෘත කරගැනීම සඳහා ඩොලර් මෙරට තිබුණේ නැත. ඒ වකවානුව තුළ නම් මේ අර්බුද නිසා මෙරට ඉන්ධන පාරිභෝජනය ඉතාම අඩුවීම සිදුව තිබුණු බව සත්‍යයකි.

එහෙත් වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ රටේ වගකීම භාරගැනීමෙන් පසුව එම ගැටලුව විසඳීම සඳහා කඩිනම් පියවර ගැනීමට සමත් වීම මත ඉන්ධන හිඟයට පිළියම් යෙදිනි. ඉන්ධන පෝලිම් අවසන් කරන ලදී. හිඟය කළමනාකරණය කරගැනීම වෙනුවෙන් QR ක්‍රමයක් යොදා ගනිමින් බෙදාහැරීම මුල් අවස්ථාවේ ක්‍රියාත්මක කළ අතර කෙටි කලකින්ම QR ක්‍රමය අත්හැර ඉන්ධන පාරිභෝගිකයන්ට ඇති තරම් ඉන්ධන ලබාගැනීමේ හැකියාව සකස් කරන ලදී.

රටේ අවශ්‍යතාවයට සරිලන තරම් ඉන්ධන තොග ගෙන්වා බෙදාහැරීම සිදුකරන ලද අතර මේ වන විට ඉදිරි මාස කිහිපය සඳහා අවැසි ඉන්ධන තොගද මෙරට තිබේ.

එසේම යළි ඉන්ධන හිඟයක් සහ ඉන්ධන බෙදාහැරීම ගැටලුවක් නොවෙන්න පිළියම් යොදන ලදී. මෙරට ඉන්ධන වෙළඳපොළට නව විදේශ ආයෝජකයන් කැඳවා තරගකාරී මිලකට ඉන්ධන බෙදාහැරීම විධිමත් කිරීමට පියවර ගන්නා ලදී. එහි ප්‍රතිලාභයන්ද නුදුරේම ජනතාවට ලැබෙනු ඇත.

| TOTAL SALES | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DATE | PRODUCT | | | | | | | | | | | |
| | LAD | | LSD | | LK | | LP 95 | | LP 92 | | LIK | |
| | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) |
| 2023.04.08 | 5,433,774 | 4,597 | 85,800 | 73 | 237,600 | 187 | 118,800 | 91 | 5,603,400 | 4,281 | - | - |
| 2023.04.09 | 112,080 | 95 | - | - | - | - | - | - | - | - | - | - |
| 2023.04.10 | 5,430,630 | 4,594 | 92,400 | 78 | 280,500 | 220 | 112,200 | 86 | 5,827,800 | 4,452 | 6,600 | 5 |
| 2023.04.11 | 5,847,492 | 4,947 | 112,200 | 95 | 346,500 | 272 | 330,000 | 252 | 5,844,300 | 4,465 | - | - |
| 2023.04.12 | 5,744,719 | 4,860 | 297,000 | 251 | 290,400 | 228 | 561,000 | 429 | 8,368,800 | 6,393 | - | - |
| 2023.04.13 | 2,972,933 | 2,515 | 66,000 | 56 | 125,400 | 99 | 105,600 | 81 | 4,930,200 | 3,766 | - | - |
| 2023.04.14 | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| Total | 25,541,628 | 21,609 | 653,400 | 553 | 1,280,400 | 1,006 | 1,227,600 | 938 | 30,574,500 | 23,357 | 6,600 | 5 |
| Average (PER DAY) | 3,648,804 | 3,087 | 93,343 | 79 | 182,914 | 144 | 175,371 | 134 | 4,367,786 | 3,337 | 943 | 1 |
| Average Loads (Per Day) | 553 | | 14 | | 28 | | 27 | | 662 | | 0 | |

Source - SAP - MCSI
Date & Time - 08.04.2024 / 09.30 A.M.
Prepared by - ASITHA-MKT

| TOTAL SALES | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DATE | PRODUCT | | | | | | | | | | | |
| | LAD | | LSD | | LK | | LP 95 | | LP 92 | | LIK | |
| | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) | LTR. | MT. (AVG) |
| 2024.04.01 | 4,516,422 | 3,821 | 85,800 | 73 | 679,800 | 534 | 92,400 | 71 | 3,887,400 | 2,970 | - | - |
| 2024.04.02 | 5,212,989 | 4,410 | 422,400 | 357 | 1,115,400 | 876 | 330,000 | 252 | 4,207,500 | 3,214 | 6,600 | 5 |
| 2024.04.03 | 4,727,289 | 3,999 | 244,200 | 207 | 990,000 | 778 | 217,800 | 166 | 3,729,000 | 2,849 | 6,600 | 5 |
| 2024.04.04 | 4,641,565 | 3,927 | 204,600 | 173 | 561,000 | 441 | 158,400 | 121 | 3,550,800 | 2,713 | 6,600 | 5 |
| 2024.04.05 | 4,668,046 | 3,949 | 138,600 | 117 | 590,700 | 464 | 171,600 | 131 | 3,778,500 | 2,887 | 6,600 | 5 |
| 2024.04.06 | 5,760,280 | 4,873 | 145,200 | 123 | 501,600 | 394 | 59,400 | 45 | 5,256,900 | 4,016 | 13,200 | 10 |
| 2024.04.07 | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| Total | 29,526,591 | 24,980 | 1,240,800 | 1,050 | 4,438,500 | 3,487 | 1,029,600 | 787 | 24,410,100 | 18,648 | 39,600 | 31 |
| Average (PER DAY) | 4,218,084 | 3,569 | 177,257 | 150 | 634,071 | 498 | 147,086 | 112 | 3,487,157 | 2,664 | 5,657 | 4 |
| Average Loads (Per Day) | 639 | | 27 | | 96 | | 22 | | 528 | | 1 | |

Source - SAP - MCSI
Date & Time - 08.04.2024 / 09.30 A.M.
Prepared by - ASITHA-MKT

මේ වන විට මෙරට සිපෙට්කෝ සමාගමට අමතරව ඉන්දියානු තෙල් සමාගම සහ චීනයේ සයිනොපෙක් තෙල් සමාගම ඉන්ධන බෙදාහැරීම සිදු කරමින් තිබේ. ඇමරිකාවේ ෂෙල් සමාගම හා ඔස්ට්‍රේලියාවේ යුනයිටඩ් පෙට්‍රෝලියම් සමාගම ද නුදුරේම තෙල් බෙදාහැරීමේ කටයුතු සූදානම් කර තිබේ. මේ අතර සයිනොපෙක් සමාගම හම්බන්තොට දැවැන්ත තෙල් පිරිපහදුවක් ආරම්භ කිරීම සඳහා ද සූදානම් වෙමින් තිබේ. ඒ අනුව මෙම ආසියානු කලාපය තුළ ඉන්ධන බෙදාහැරීමේ පුළුල් ව්‍යාපාරයක් මෙරට ස්ථාපිත වෙනු ඇත. එසේම ඒ අනුව ද නුදුරේදී මෙරට ඉන්ධන මිලෙහි අඩුවීමක්ද සිදුවෙනු ඇතැයි පුරෝකතනය කර තිබේ.

ඛනිජ තෙල් සංස්ථාවේ (සිපෙට්කෝ) සංඛ්‍යා දත්ත අනුව 2023 මුල් කාර්තුව තුළ ලංකා ඔටෝ ඩීසල් අලෙවි කර ඇති ප්‍රමාණය සහ 2024 මුල් කර්තුව තුළ අලෙවි කර ඇති ප්‍රමාණය සැසඳීමේදී සියයට 9ක අඩුවීමක් පෙන්වයි. (අදාල වගුව බලන්න). එසේම ලංකා පෙට්‍රෝල් අලෙවිය ද මෙම කාල සීමාව තුළ සියයට 9ක අඩුවක් පෙන්වයි. භූමිතෙල් භාවිතය සියයට 103කින් ඉහළ ගොස් ඇත. යුරෝ 4 ඩීසල් අලෙවිය සියයට 3කින් සහ ලංකා පෙට්‍රෝල් 95 යුරෝ 4 සියයට 5කින් අඩු වීමක් පෙන්වයි.

එහෙත් මෙම අඩුවීමක් පෙන්වන්නේ ද සිපෙට්කෝ සමාගම සතුව 2023 වසරේදී තිබූ ඉන්ධන පිරවුම් හල් 1,197 ප්‍රමාණයෙන් 150ක් එනම් සියයට 12ක්, එම වසරේ අගෝස්තු මාසයේදී සයිනොපෙක් සමාගමට ලබා දී තිබූ තත්වයන් අනුවය. මේ අනුව ඉන්ධන අලෙවියෙහි යම් වැඩිවීමක් මිස කිසිසේත්ම ඉන්ධන අලෙවියෙහි අඩුවීමක් සිදුව නැති බව පැහැදිලිය.

එමෙන්ම පසුගිය වසරේ අප්‍රේල් මාසයේ මුල සහ මෙවර මෙම කාලය හා සැසඳීමේදී ඉන්ධන පාරිභෝජනය තවදුරටත් ඉහළ ගොස් ඇති බවත් පැහැදිලිය. අනෙක් සමාගම්වල තත්වයන්ද මීට වඩා වෙනස් වීමට හේතුවක් නැත.

මේ වන විටත් රටත් ජනතාවත් මුහුණ දෙමින් සිටි ආර්ථික අර්බුදයන් විසඳාගෙන තවමත් පූර්ණ ස්ථාවරත්වයකට පත්ව නැති බව සිහිබුද්ධියක් ඇති ඕනෑම අයකුට පැහැදිලි තත්වයකි. එහෙත් ඉතා වේගයෙන් තත්වයන් සමනය වෙමින් තිබෙන බවත් පිළිගත යුත්තකි. මෙවර අවුරුදු වෙනුවෙන් ජනතාවගේ සූදානම් වීමත් පෙර වසර තුන තුළ දකින්නට ලැබුනු තත්වයන්ට වඩා ඉහළින්ම සිදුවෙන බවත් පෙන්නෙන්ට තිබෙන සත්‍යයය.

රටේ මේ වන විට සිදුවන ආර්ථික වර්ධනය ක්‍රමයෙන් සහ වේගයෙන් සිදුවීම දරාගැනීමට නොහැකි විපක්ෂ පිරිස්, ජනතාව නොමඟ යවමින් සත්‍යය කරුණු බෙදාහරිමින් තිබෙන බව මේ අනුව පැහැදිලි අතර මෙවැනි බොරු ප්‍රචාරයන්ගෙන් රැවටී නොසිට සත්‍යය කුමක්ද යන්න සොයා බැලීම ජනතාවට තමන්ගේ ජීවිත යළි අර්බුදයට පත් කර නොගැනීමට හේතු වනු ඇති බවත් සඳහන් කර සිටිමු.